## ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

#### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. බිලියන 4.3 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. බිලියන 3.4 ක් වුයෙන් අතිරික්තය රු. බිලියන 0.9 කින් හෙවත් සියයට 26 කින් වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

#### 2.2 වත්කම් තත්ත්වය

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, ඉකුත් වර්ෂය අවසානයට මුළු වත්කම් රු. බිලියන 5.5 සමග සැසඳීමේදී 2012 දෙසැම්බර් 31 දිනට රක්ෂණ යෝජනා ක්‍රමයේ මළු වත්කම් රු. බිලියන 9.7 ක් විය. 2012 දෙසැම්බර් 31 දිනට පැවති මුළු වත්කම් අතුරින රු. බිලියන 8.8 ක් හෙවත් සියයට 91 ක් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැදුම්කර මගින් නියෝජනය විය.